සියලුම හිමිකම් ඇවිරිණි.

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**Provincial Department of Education - NWP**

පළමු වාර පරීක්ෂණය - 2016
**First Term Test - 2016**

ගණිතය - 6 ශ්‍රේණිය    කාලය පැය 02 යි.

නම:.......................................................................................................

# I පත්‍රය

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම පත්‍රයේම සපයන්න.

01. පහත සඳහන් දෑ අතුරින් වෘත්තාකාර හැඩය දැකිය හැකි වස්තු තෝරා යටින් ඉරක් අඳින්න.

රබාන, කුල්ල, වාහනයක සුක්කානම, තේ හැන්ද

---

02. වෘත්ත රටා භාවිත කර, කරන ලද නිර්මාණ වලට නිදසුන් 2ක් ලියන්න.

---

03. අගය සොයන්න.

52 × 30 = ..............................

---

04. විශාල පෙට්ටියක සබන් කැට අසුරන ලද කුඩා පැකට්ටු 12ක් ඇත. ඒවායේ ඇති මුළු සබන් කැට ගණන 144ක් නම් කුඩා පැකට්ටුවක ඇති සබන් කැට ගණන කොපමණද?

---

05. පෘථිවියේ සිට සූර්යයාට ඇති දුර කිලෝ මීටර් 149 597 870 කි. මෙම සංඛ්‍යාව වචනයෙන් ලියන්න.

---

06. දස ලක්ෂය සම්මත ක්‍රමයට ඉලක්කමින් සහ වචනයෙන් ලියන්න.

---

07. සුජිත් රු. 150.00ක් දී රු. 108.00ක ඔහුට අවශ්‍ය පොත් සහ පෑන් මිල දී ගත්තේ ය. ඔහුට ඉතිරි ලෙස ලැබෙන මුදල කොපමණද ?

---

08. නිරංජන්ගේ පසුගිය මාසයේ වැටුප රු. 27 350.00 කි. විශේෂ දීමනාවක් ලෙස ලබාදුන් රු. 7 050.00ක මුදලකින් මෙම මාසයේ ඔහුගේ වැටුප වැඩි විය. එසේ නම් මේ මාසයේ ඔහුගේ නව වැටුප කොපමණ ද?

09. පෙරවරු 6.20ට නිවසෙන් පිට වූ සුරේෂ් පෙරවරු 7.05 වන විට පාසලට පැමිණෙයි. ඔහුට පාසලට පැමිණීමට ගතවන කාලය කොපමණ ද?


---

10. හිස්තැන් පුරවන්න.

(අ) මිනිත්තු 150 = පැය ................ .... මිනිත්තු ......................  (ආ) මිනිත්තු 3 = තත්පර ....................

---

11. පහත සංඛ්‍යා රේඛාව මත -3 සහ 2 යන අගය නිරූපණය කරන්න.




---

12. හිස්තැන්වලට සුදුසු සංඛ්‍යා වරහන් තුළින් තෝරා ලියන්න.

(අ) .......... > -1  (-2, -5, 1)  (ආ) -3 < ..........  (-4, 0, -6)

---

13. පහත සංඛ්‍යා අවරෝහණ පටිපාටියට ලියන්න.

0, -4, 2, -1

---

14. -2 සහ 3 අතර ඇති සියලුම නිඛිල සංඛ්‍යා ලියා දක්වන්න.

---

15. ඔබ නිමානය භාවිත කරන අවස්ථාවලට උදාහරණ 2ක් දෙන්න.

---

16. සචිනි වාර පරීක්ෂණය සඳහා ලබාගත් ලකුණු ආසන්න 10ට වැටයූ විට එය 80ක් විය. ඇය ලබාගත් ලකුණු විය හැකි උපරිම සහ අවම අගය ලියන්න.

(අ) උපරිම - ...............................................  (ආ) අවම - ...............................................


---

17. පහත දක්වා ඇති අවස්ථාවලදී ඔරලෝසුවේ පැය කටුව සහ මිනිත්තු කටුව අතර සෑදෙන කෝණය ලියා දක්වන්න.

(අ) පෙ. ව. 9.00 - ...............................................  (ආ) ප. ව. 6.00 - ...............................................

---

18. පහත රූප සටහනේ දක්වා ඇති කොටස් නම් කරන්න.



---

19. තලයක තිරස් බව දැනගැනීමට භාවිත කරන උපකරණය කුමක් ද?

---

20. පහත වගන්ති නිවැරදි නම් ✓ ලකුණ ද, වැරදි නම් × ලකුණ ද ප්‍රකාශයට ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

(අ) දකුණ සහ බටහිර දිශා දෙක අතර ගිනිකොණ දිශාව පිහිටයි. (  )

(ආ) ගුරු මේසයේ මතුපිට තිරස් තලයකට උදාහරණයකි. (  )

සියලුම හිමිකම් ඇවිරිණි.

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**Provincial Department of Education - NWP**

පළමු වාර පරීක්ෂණය - 2016
# First Term Test - 2016

ගණිතය - 6 ශ්‍රේණිය

නම:..............................................................................................................................

## II පත්‍රය

- පළමු ප්‍රශ්නයටත් තවත් ප්‍රශ්න 04කටත් පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නය සඳහා ලකුණු 16ක් ද, අනෙකුත් ප්‍රශ්න සඳහා ලකුණු 11 බැගින් ද හිමි වේ.

01. පහත වගුවේ දැක්වෙන්නේ සමීරගේ සහ සුනිමල්ගේ නිවෙස් සඳහා සතියකට මිල දී ගත් ද්‍රව්‍ය කිහිපයක් පිළිබඳ තොරතුරු සමූහයකි.

| ද්‍රව්‍ය | සමීරගේ නිවස සඳහා මිලදී ගත් ද්‍රව්‍ය ප්‍රමාණ | සුනිමල්ගේ නිවස සඳහා මිලදී ගත් ද්‍රව්‍ය ප්‍රමාණ |
|---|---|---|
| සීනි - කිලෝග්‍රෑම් 1 ක මිල රු. 90.00 | කිලෝග්‍රෑම් 2 | කිලෝග්‍රෑම් 1 |
| සහල් - කිලෝග්‍රෑම් 1 ක මිල රු. 75.00 | කිලෝග්‍රෑම් 6 | කිලෝග්‍රෑම් 3 |
| තේ කොළ - ග්‍රෑම් 100 ක මිල රු. 96.00 | ග්‍රෑම් 200 | ග්‍රෑම් 100 |
| පරිප්පු - කිලෝග්‍රෑම් 1 ක මිල රු. 200.00 | කිලෝග්‍රෑම් 1 | ග්‍රෑම් 500 |

i. මෙම තොරතුරු ලබාගත හැකි ක්‍රමයක් සඳහන් කරන්න.

ii. සමීරගේ නිවසට අවශ්‍ය සහල් ප්‍රමාණය .................. සුනිමල්ගේ නිවසට අවශ්‍ය හාල් ප්‍රමාණය යන්නෙහි හිස්තැනට සුදුසු පරිදි "$<$" ලකුණ යොදා සංසන්දනය කරන්න.

iii. සමීරගේ නිවසට සතියක් සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිල දී ගැනීම වෙනුවෙන් බිල්පතක් සකස් කර සමීරගේ නිවසට සතියක් සඳහා අවශ්‍ය වන ද්‍රව්‍ය සඳහා වැයවන මුදල සොයන්න.

iv. සුනිමල්ගේ නිවස සඳහා සතියකට අවශ්‍ය වන ද්‍රව්‍ය මිල දී ගැනීම සඳහා යන වියදම සමීරගේ නිවස සඳහා යන වියදමට වඩා අඩු ද? වැඩි ද? සුනිමල්ගේ නිවසට යන වියදම කොපමණද?

02. i. 75 305 යන සංඛ්‍යාව ගණක රාමුවක නිරූපණය කරන්න.

ii. මෙම සංඛ්‍යාවේ සියස්ථානයේ ඇති ඉලක්කම කුමක් ද?

iii. 7[5]30(5) මෙහි □ තුළ දක්වා ඇති ඉලක්කමේ වටිනාකම ◯ තුළ දක්වා ඇති ඉලක්කමේ වටිනාකම මෙන් කී ගුණයක් ද?

iv. 4200185 සංඛ්‍යාව සම්මත ක්‍රමයට ලියන්න. එම සංඛ්‍යාව වචනයෙන් ද ලියන්න.

v. ඉහත iv වන කොටසේ ඔබ දැක්වූ සංඛ්‍යාවට අයත් කලාප නම් කර දක්වන්න.

3. (අ) i. 2500 × 10 = ......................

ii. 67 × 0 = ......................

iii. 99000 ÷ 100 = ......................

iv. 540 ÷ 5 = ......................

(ආ) විදුලි පන්දමක මිල රු. 764.00 කි. එම මිල ආසන්න 10 ගුණාකාරයට වටයන්න.

(ඇ) සුජානිගේ නිවසේ සාමාජිකයින් සංඛ්‍යාව 5කි. ඔවුන් සියලුදෙනාම දිනකට තුන් වතාවක් තේ පානය කරති.

i. නිවසේ සාමාජිකයින් සඳහා එක් දිනකට පිළියෙල කරන තේ කෝප්ප ගණන කොපමණ ද?

ii. සතියක දී තේ කොළ සහ සීනි සඳහා රු. 350.00ක් වැය වුණි නම් එක් දිනක් සඳහා තේ කොළ සහ සීනි වලට වැය වන මුදල කොපමණ ද?

4. (අ) වේදිකා නාට්‍යයක් ප්‍රදර්ශනය සඳහා සකස් කර තිබූ ප්‍රචාරක දැන්වීමක කොටසක් පහත දැක්වේ.

| | |
|---|---|
| පාසල් දර්ශනය | පෙ. ව. 10.30 - ප. ව. 12.30 |
| මහජන දර්ශනය | ප. ව. 2.15 - ප. ව. 4.15 |

i. පාසල් දර්ශනය ආරම්භ වන සහ අවසාන වන වේලාව පිළිවෙළින් ලියන්න.


ii. මෙම නාට්‍යය වේදිකාගත වන කාලය කොපමණ ද?

iii. මහජන දර්ශනය ආරම්භ කරන සහ අවසන් කරන වේලාව සම්මත ආකාරයට ලියන්න.

iv. නිර්මලී පාසල් දර්ශනය නැරඹීම සඳහා පැමිණියේ පෙ.ව. 10.45ට නම් ඇය එම නාට්‍යය නැරඹූ කාලය කොපමණ ද?

(ආ) පෙ. ව. 8.30 සිට පෙ. ව. 11.45 දක්වා පැවති දෙමාපිය පන්ති රැස්වීමක දී අතරතුර මිනිත්තු 20ක විවේක කාලයක් ලබාදෙන ලදී. විවේක කාලය හැර දෙමාපියන් සඳහා රැස්වීම පැවති කාලය කොපමණ ද?

5. A, B, K, D සහ E නම් නගර 5ක එක්තරා දිනක මධ්‍යහ්න 12.00 වන විට පැවති උෂ්ණත්වය සෙල්සියස් අංශක ($^0C$) වලින් පහත සංඛ්‍යා රේඛාව මත දක්වා ඇත.




i. වැඩිම උෂ්ණත්වයක් පෙන්නුම් කරන්නේ කුමන නගරයේ ද?


ii. මෙම සංඛ්‍යා රේඛාව පිළිතුරු පත්‍රයේ පිටපත් කරගන්න. F නම් නගරයක උෂ්ණත්වය සෙල්සියස් අංශක 8ක් නම් එම උෂ්ණත්වය සංඛ්‍යා රේඛාව මත ලකුණු කරන්න.

iii. B, E එකම ලක්ෂ්‍යයක ලකුණු කිරීමට හේතුව කුමක් ද?

iv. A නගරයට වඩා K නගරයේ උෂ්ණත්වය අඩු ද? වැඩි ද? ඒ කොපමණ ප්‍රමාණයකින් ද?

v. K නගරයේ උෂ්ණත්වය, D නගරයේ උෂ්ණත්වය මෙන් කී ගුණයක් ද?

06. 6 ශ්‍රේණියේ සිසුන් පන්ති කාමරය තුළ කරන ලද ක්‍රියාකාරකමක දී පොල් ඉරටුවලින් විවිධ කෝණ සකස් කර තිබූ අයුරු පහත දැක්වේ.




i. ඉහත රූප සටහන් අතුරින් සුළු කෝණ නිරූපණය වන රූපසටහන්වල අක්ෂරය/අක්ෂර මොනවාද?

ii. මෙහි මහා කෝණ කීයක් තිබේ ද? ඒවා නම් කරන්න.

iii. B අක්ෂරය මඟින් දැක්වෙන්නේ කවර කෝණ වර්ගයක් ද? එම කෝණ පරිසරයේ දැකිය හැකි අවස්ථාවක් සඳහන් කරන්න.

iv. C වලින් දක්වා ඇත්තේ කවර වර්ගයේ කෝණ ද?


v. a) නැගෙනහිර දිශාවට හැරී සිටි අයෙකු බස්නාහිර දිශාවට හැරීමේ දී එම භ්‍රමණය තුළින් සෑදෙන්නේ කුමන වර්ගයේ කෝණ ද?

b) ඉහත රූපයේ එම කෝණ වර්ගය දක්වා ඇති අක්ෂරය/අක්ෂර සඳහන් කරන්න.

- - www.mathspapers.info - -



07. එක්තරා නගරයක ආයතන කිහිපයක් පිහිටා ඇති ආකාරය පහත රූප සටහනේ දක්වා ඇත.




i. පාසල පිහිටියේ බස්නැවතුම්පොළේ සිට කුමන දිශාවේ ද?

ii. බස්නැවතුම්පොළේ සිට බස්නාහිර දිශාවේ පිහිටා ඇත්තේ කුමක් ද?

iii. පොලීසිය පිහිටියේ බස්නැවතුමේ සිට කුමන දිශාවේ ද? කොපමණ දුරින් ද?

iv. බස්නැවතුම්පොළේ සිට නිරිත දිශාවේ පුස්තකාලය පිහිටියේ නම් එය කවර ආයතන 2 අතර පිහිටයි ද?

v. දිශාව සොයා ගැනීම සඳහා භාවිත කරන උපකරණයේ නම කුමක් ද?

vi. ඉහත v හි ඔබ සඳහන් කළ උපකරණය භාවිත කරන අවස්ථා 2ක් සඳහන් කරන්න.



MATHS PAPERS.INFO
ඔබට අවශ්‍ය සියලුම ගණිත ප්‍රශ්න පත්‍ර ( mathspapers.info ) වෙතින් පහසුවෙන්ම ලබාගන්න